දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ – மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

ඉසුරුපාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.
இசுருபாயா ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

මගේ අංකය / எமது இல. / My No ඊඩී/01/11/01/01/0 ආගමික හා සාරධර්ම අංශය

දිනය / திகதி / Date 2013.01. 10

චක්‍රලේඛ අංක: 05/2013

සියලු පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂවරුන්,
සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂවරුන්,
සියලු බුද්ධ ධර්මය විෂය අධ්‍යක්‍ෂවරුන්,
සියලු කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්‍ෂවරුන්,
ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
සියලු විදුහල්පතිවරුන්,
සියලු බුද්ධ ධර්මය ගුරු උපදේශකවරුන්.

## ශ්‍රී බුද්ධ වර්ෂ 2557 වෙසක් සතිය වැඩසටහන
## "තෙමඟුල සමරමු - පිළිවෙත් සපුරමු"
## (2013.05.21- 2013.05.27 දක්වා)

ශ්‍රී බුද්ධ වර්ෂ 2557 වෙසක් පුර පසළොස්වක පොහොය ව්‍යවහාර වර්ෂ 2013 මැයි 24 දිනට යෙදී ඇත. ඒ නිමිත්තෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සමස්ත පාසල් පද්ධතිය සඳහා 2013-05-21 දින සිට 2013-05-27 දින දක්වා එම දෙදින ද ඇතුළත් වන පරිදි වෙසක් සති වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

02. ජාතික වෙසක් උත්සවය බුත්තල යුදගනාව රජමහා විහාරස්ථානයේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2013 මැයි මස 25 වෙනි දින උත්කර්ෂවත් අයුරින් පැවැත්වේ.

03. ශ්‍රී බුද්ධ වර්ෂ 2557 වෙසක් සති වැඩසටහනේ ආදර්ශ සැලැස්ම මේ සමග ඉදිරිපත් කරන අතර එය තම පාසලට ගැලපෙන අයුරින් ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දනුම් දෙමි.

| දිනය | තේමාව | ආදර්ශ වැඩසටහන |
|---|---|---|
| 2013-05-21 අඟහරුවාදා | ''සුපසන් පරිසරයක් පිවිතුරු මනසක්'' | පාසල්, නිවාස,ආගමික හා පොදු ස්ථාන පිරිසිදු කිරීමේ ශ්‍රමදානය. |
| 2013-05-22 බදදා | ''සැදැහැ සිතින් තෙමඟුලට සැරසෙමු'' | වෙසක් සැරසිලි,වෙසක් සුභ පැතුම්පත් හා නිර්මාණ සැකසීම, ඒවා ප්‍රදර්ශනය කිරීම ආරම්භය. |
| 2013-05-23 බ්‍රහස්පතින්දා | ''සාධු සබ්බත්ථ සංවරෝ'' | පාසල් මට්ටමින් ශීල සමාදාන වැඩසටහන. |
| 2013-05-24 සිකුරාදා | ''පරමාය පූජාය පටිපත්ති පූජාය'' | ආසන්න විහාරස්ථානයේ සිල්සමාදන්වීම, වන්දනාමාන කිරීම, දන්සල් පැවැත්වීම හා සැදැහැ ගී ප්‍රසංග පැවැත්වීම,පාසලේ බුදුමැදුර ආලෝකමත් කිරීම හා වෙසක් කූඩු, වෙසක් පහන් දැල්වීම |
| 2013-05-25 සෙනසුරාදා | ''නරඹමු,දනුවත්වෙමු, බෞද්ධ පිළිවෙතේ හැසිරෙමු'' | සැදැහැගී ප්‍රසංග පැවැත්වීම, වෙසක් සැරසිලි ප්‍රදර්ශනය හා පහන් කූඩු දැල්වීම, සිද්ධස්ථාන නැරඹීම, වන්දනාමාන කිරීම. |
| 2013-05-26 ඉරිදා | ''පරත්ථං පටිපජ්ජථ'' | සුභ සාධන හා සමාජ සේවා කටයුතු (ගිලනුන්ට, අනාථ ළමුන්ට,වැඩිහිටියන්ට උවටැන් කිරීම, සත්ව කරුණාව දැක්වීම, පුණ්‍යාධාර ලබාදීම හා අනෙකුත් පුණ්‍ය කටයුතු) සිද්ධස්ථාන නැරඹීම,වන්දනාමාන කිරීම. |
| 2013-05-27 සඳුදා | ''ධම්මපීති සුඛංසෙති'' | දහම් දනුම මිනුම නිපුණතා ඇගයීම, ආගමික හා සෞන්දර්ය නිපුණතා දැක්වූ සිසුන්ට ත්‍යාග සහතික ලබාදීම, වෙසක් සති වැඩ සටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය. |

04. පොදු උපදෙස්

i. ආරම්භක දිනයේ වෙසක් සතිය වැඩ සටහන පිළිබඳව ආචාර්ය මණ්ඩලය සිසුන් හා දෙමව්පියන් දනුවත් කිරීම.

ii. මෙම කාලය තුළ පාසල් භූමිය බෞද්ධ ධජවලින් අලංකාරවත් කර තැබීම.

iii. ප්‍රධාන තේමා පාඨය වන ''තෙමඟුල සමරමු - පිළිවෙත් සපුරමු'' යන්න සටහන් බැනරයක් පාසල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම.

iv. සෑම දිනකම උදෑසන, දිනයේ තේමාවට අදාළව විනාඩි 5 ක ධර්මානුකූල කථාවක් පැවැත්වීම.

05. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී බෞද්ධ සිසුන් බහුතරයක් සිටින පාසල්වල හා වෙනත් ආගමික සිසුන් බහුතරයක් සිටින පාසල්වල එය සුදුසු පරිදි ක්‍රියාවට නැගීම විදුහල්පතිවරුන්ගේ වගකීම වේ.

06. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් කලාපයේ සියලු විදුහල්පතිවරුන් වෙත මෙම චක්‍රලේඛයේ පිටපත් ලබාදී ඒ පිළිබඳ දැනුවත් කිරීම් කළ යුතුය. මෙම වැඩසටහන පිළිබඳව බුද්ධ ධර්ම විෂය අධ්‍යක්ෂ, කොට්ඨාස අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන් මගින් නියාමන වැඩසටහනක් ක්‍රියාත්මක කරවන ලෙසද නියාමන වාර්තාවක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත හා මා වෙත ජූනි 5 දිනට පෙර එවන ලෙසද කාරුණිකව දැනුම් දෙමි.

එස්.එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

01. ජනාධිපති ලේකම්
02. ලේකම් - බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය
03. ලේකම් - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
04. අතිරේක ලේකම්වරුන්
05. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
06. විභාග කොමසාරිස් ජනරාල්
07. අධ්‍යක්ෂ ජනරාල් - ජා.අ.ආ.
08. ප්‍රධාන කොමසාරිස් - විද්‍යාපීඨ හා ගුරු අධ්‍යාපන පරිපාලන
09. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
10. අධ්‍යාපන අධ්‍යක්ෂ - පිරිවෙන්